**නාගොඩ ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 29 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.2,462,802 ක් වූ දායක මුදල් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**---------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.122,192,256 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර අසමානතා වල එකතුව රු.41,379,542 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**
---------------------

2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.18,315 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
-----------------------------------

**(අ) ලැබිය යුතු ගිණුම්**
-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට හිඟ, එකතු කළ අගය මත බදු සහ මුද්දර බදු එකතුව රු.3,029,368 ක් 2013 වර්ෂයට පෙර සිට පැවත එන අතර, එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** **ගෙවිය යුතු ගිණුම්**

--------------------

සභා බලප්‍රදේශයේ සිදුකළ සංවර්ධන ව්‍යාපෘති 17 ක් වෙනුවෙන් ගෙවිය යුතු ඉකුත් වර්ෂයට පෙර සිට පැවත එන එකතු වටිනාකම රු.862,718 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

**------------------------------------------------**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

--------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.51,060,617 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**---------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | | **වටිනාකම** | **අනුකූල නොවීම්** |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | |
| | 172(2) වගන්තිය | 995,887 | 1998 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | |
| | රීති 218 | - | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ සමීක්ෂණය කර නොතිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | මුදල් රෙගුලාසි 396(ඈ) | 73,405 | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්ම වූ චෙක්පත් 36 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,029,616 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,944,750 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 65,000 | 65,553 | 6,622 | 58,931 | 65,000 | 62,720 | 18,700 | 44,020 |
| (ii) | කුලී | 3,512,720 | 3,497,720 | 2,907,606 | 590,114 | 3,839,420 | 3,501,720 | 2,199,775 | 1,301,945 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 600,000 | 778,918 | 778,918 | - | 600,000 | 818,566 | 818,566 | - |
| | | 4,177,720 | 4,342,191 | 3,693,146 | 649,045 | 4,504,420 | 4,383,006 | 3,037,041 | 1,345,965 |

#### 2.2.2 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබුණු රු.109,573 ක් වූ අක්කර බදු මුදලින් වර්ෂය තුළ සියයට 07 ක් තරම් අවම අගයක් අය කරගෙන තිබුණි. හිඟ බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට වූ හිඟ අක්කර බදු ශේෂය රු.58,931 ක් දක්වා වර්ධනය වී තිබුණි.

#### 2.2.3 කුලී

**(අ) කඩකුලී**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබුණු රු.4,799,665 ක් වූ කඩකුලී වලින් වර්ෂය තුළ සියයට 61 අය කරගෙන තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා වර්ෂය අවසාන වනවිට තවදුරටත් අයවිය යුතු හිඟ කඩකුලී ශේෂය රු.590,114 ක් විය.

(ආ) **බදුකුලී**

**---------**

සභා බලප්‍රදේශය තුළ පිහිටි පොළවල් 02 ක් බදුදීම වෙනුවෙන් එකතුව රු.313,227 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හිඟහිට පැවති අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.4,504,684 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.3,776,354 ක් ලැබිය යුතුව පැවති අතර, උසාවි දඩ වෙනුවෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේ දී ලැබී නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කාර්යයසාධනය**

**------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් වෙනුවෙන් පමණක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

(ආ) **කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ උපමානපාදක ප්‍රදාන / පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සභාවට ලද සංවර්ධන ව්‍යාපෘති 12 ක් අතුරින් ව්‍යාපෘති 03 ක් අවලංගු කර තිබූ අතර, ව්‍යාපෘති 05 ක් 2018 අප්‍රේල් 09 දින වනවිටත් වැඩ ආරම්භ කර නොතිබුණි. එසේම පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී.1,000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ එක් ව්‍යාපෘතියක් 2018 අප්‍රේල් 09 දින තෙක් ආරම්භ කර නොතිබුණි.

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

සභා බලප්‍රදේශයේ තෝරාගත් ප්‍රදේශවලින් එකතු කරනු ලබන කසළ උඩුගම ඇප්ත්‍රෝප්වත්ත ඉඩමට බැහැර කරන අතර, දිරන කසළ වලින් කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු කරමින් තිබුණි. නොදිරන ද්‍රව්‍ය වලින් අලෙවි කළ හැකි ද්‍රව්‍ය අලෙවි කර, ඉතිරිය අංගනයේ බාහිර ස්ථානයක වලකට බැහැර කර, පස් දමා වැසීම සිදු කරමින් පැවතුණි. කසළ බැහැර කරනු ලබන ඉඩමෙහි අයිතිය ප්‍රාදේශීය ලේකම්වරයා සතු වූ නමුත්, එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PL/1/5/12 දරන කසළ කළමනාකරණ කටයුතු විධිමත් කිරීම යටතේ නිකුත් කළ චක්‍රලේඛයට අදාළ

මාර්ගෝපදේශය අනුව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙනම ඒකකයක් ස්ථාපනය කර, දිගුකාලීන සැලැස්මක් ඉදිරිපත් කළයුතු නමුත්, සභාවට එවැනි වැඩපිළිවෙලක් නොතිබුණි. මේ සඳහා පරිසර බලපත්‍රයක් ද ලබාගෙන නොතිබුණි.

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

**----------------------------**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**(ඉ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

--------------------------------------

සභාවේ ප්‍රධාන කාර්යාලය පුළුල් කිරීම සඳහා 2014 හා 2015 වර්ෂවල රු.591,246 ක් වැයකර, ප්‍රධාන කාර්යාලයට නව කොටසක් එකතු කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි කටයුතු අවසන් නොවීම නිසා අදාළ ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකි වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බලප්‍රදේශයේ සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන එම ප්‍රදේශවලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) උප වගන්ති ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර, වරිපනම් බදු අයකිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1553/16 දරන ගැසට් පත්‍රයේ පළමු උපලේඛනයේ "ඇ" කොටසෙහි සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධව ප්‍රාදේශීය සභාවක් විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කළයුතු වුවත්, සභා බලප්‍රදේශයේ පැවති එවැනි කර්මාන්ත 14 ක් සම්බන්ධව පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබූ අතර, ඒ සඳහා නීත්‍යානුකූලව කටයුතුකර නොතිබුණි.

(ඇ) සභාව සතු කඩ කාමර 07 ක් වර්ෂ 16 කට අධික කාලයක් තිස්සේ බදු දී තිබූ නමුත්, 2010 දෙසැම්බර් 27 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක:දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව ගිවිසුම්ගතව නොතිබුණි.

(ඈ) 2003, 2007 හා 2013 වර්ෂවලදී රිසිට් පොත් 10 ක්, උප පත්‍රිකා පොත් 26 ක්, බිල් පොත් 14 ක්, පුස්තකාල දඩ කුවිතාන්සි පොත් 12 ක් සහ පෙර පාසල් ගාස්තු අය කිරීමේ පොත් 47 ක් අස්ථානගත වී තිබූ නමුත්, ඒ පිළිබඳව කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවයේ යොදවා තිබූ තනතුරු 11 ක අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමටත් තනතුරු 10 ක පැවති පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2014 හා 2015 වර්ෂවල මිලදී ගත් රු.132,788 ක් වටිනා ට්‍රැක්ටර් ටයර් 04 ක් සහ ට්‍රැක්ටර් ට්‍රේලර් ටයර් 02 ක් ලේඛන ගතනොකර, ප්‍රයෝජනයට ගැනීමකින් ද තොරව ගබඩාවේ තිබුණි.

(ආ) ගබඩාව තුළ තිබූ පාපැදියක වටිනාකම සභාවේ ස්ථාවර වත්කම් ලේඛනයට ගෙන නොතිබූ අතර, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී එය හඳුනාගෙන ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

සභාවේ භාවිතයෙන් ඉවත් කරන ලද බැකෝ යන්ත්‍රය 2011 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පවතින අතර, ජේ.සී.බී. යන්ත්‍රයක්, ට්‍රේලරයක් සහ ට්‍රේලර් ජල බවුසරයක් නිෂ්කාර්යයව සභාවට අයත් භූමියක ගාල්කර තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් වල එකතුව රු.10,362,697 ක් වූ අතර, එම වටිනාකම සියයට 10 සිට සියයට 26 අතර පරාසයක විය.

(ආ) ආදායම් විෂයයන් 05 ක් සඳහා එකතුව රු.885,195 ක අයවැය ඉක්මවා ගිය ආදායමක් නිරීක්ෂණය වූ අතර, එම වටිනාකම සියයට 02 සිට සියයට 85 අතර පරාසයක විය.

(ඇ) වියදම් විෂයයන් 09 ක එකතුව රු.10,272,188 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම සියයට 04 සිට සියයට 43 අතර පරාසයක පැවතුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

සභාව සඳහා අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ඉදිරියට එන ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබීම. |
| | | (ii) | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් නොකිරීම. |
| (ආ) | වාහන පාලනය | | නිෂ්ක්‍රීය වාහන අපහරණය නොකිරීම. |
| (ඇ) | අයවැය පාලනය | | ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම කෙරෙහි අවධානය යොමුකර, අයවැය ලේඛනය සංශෝධනය කර නොතිබීම. |
| (ඈ) | ලේඛන නඩත්තු කිරීම | (i) | ලේඛන පවත්වා නොතිබීම. |
| | | (ii) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබීම. |
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | | කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඊ) | ආදායම් රැස්කිරීම | (i) | වරිපනම් කළාප ප්‍රකාශ කර, බදු අයකර නොගැනීම. |
| | | (ii) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබීම. |